# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | **:** | **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | **:** | **2014-11-27** |
| **වේලාව** | **:** | **පෙ.ව. 10.00** |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**සහභාගී නොවූ අය:**

| | | |
|---|---|---|
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ.අසංක විජය නිල්මිනි මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි පහත සඳහන් සමාලෝචන ඉදිරිපත් කරන ලදී.

1. 2014.10.30 සභා වාර්තාවේ අංක 06:04 යටතේ සුසාන භූමි දීමනාව රු.2500කින් වැඩිකිරීමට ගත් තීරණය ,රු.4500 ක්ව තිබූ දීමනාවට රු.2500 ක් එකතුකර මුළු මුදල රු.7000 ක් ලෙස සුසාන භූමි දීමනාව ලබාදීමට කටයුතු තීරණය වූ බව සඳහන් කරන ලෙස සභාපතිතුමන් විසින් දන්වන ලදී.

2. 2014.10.30 සභා වාර්තාවේ , සභා සහභාගීත්වය යටතේ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ නම සඳහන් වී නොතිබූ බැවින් එතුමාගේ නම ඇතුළත් කිරීම.

3. 2014.10.30 සභා වාර්තාවේ අංක 06:08 හා 06:10 සඳහන් කඩ අංක ඩී 11 යන්න, මහජන පොළ එළවළු කඩ අංක 11 ලෙස නිවැරදි කිරීම.

4. 2014.10.30 සභා වාර්තාවේ යෝජනා අංක 11:01:01 සදහන් ධීවර සංස්ථාවේ වෙළෙඳසැලක් සඳහා අනුමැතිය ලබාදීමට ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාවට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් කරන ලදැයි සභා වාර්තාවේ සදහන් කිරීම පිළිබඳව ගරු උප සභාපතිතුමා තම විරෝධතාවය දැක්වූ අතර එක් එක් මන්ත්‍රීවරයන්ගේ අදහස් වෙන් වෙන්ව සභා වාර්තාවේ ඇතුළත් විය යුතු යයි පවසන ලදී. නමුත් ඡන්දයක් නොපවත්වා එසේ වෙන් වෙන්ව අදහස් දැක්වීම සභා වාර්තාව සැදීමට අනුකුල නොවන හෙයින් නැවත 2014.11.27 පැවති සභාවේදි ඒ පිළිබඳව සාකච්ඡා කොට ඡන්දයක් පවත්වා තීරණයක් ගැනීමෙන් පසු එසේ වෙන් වෙන්ව අදහස් සදහන් කිරීමට සමාලෝචන යටතේ යෝජනා කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

## 04. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.
අනතුරුව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ 2015 වර්ෂයේ ඉදිරිපත් කරන අයවැය,විශේෂිත වූ සභාවක් කැදවා දෙසැම්බර් මස හතරවෙනිදා පෙ.ව.10.00 ට නගර සභා රැස්වීම් ශාලාවේ පැවැත්වීමට නියමිත බවයි. ඒ සදහා උපදේශක සභාව,ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව,ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරින්, වැනි තෝරාගනු ලැබූ විශේෂිත පුද්ගලයන් කිහිපපොලකගේ දායකත්වයෙන් අයවැය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන බවත් වැඩිදුර අදහස් දක්වමින් පවසන ලදී.

එමෙන්ම දශක තුනක් පැවති යුද්ධය නිමාකල අතිගරු ජනාධිපතිතුමා,ශ්‍රි ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් මෙවරත් ජනාධිපති අපේක්ෂක වශයෙන් ඉදිරි වර්ෂ 6 සදහා තෝරාපත් කර ගැනීමට ගත් තීරණයට අනුමැතිය ලැබී ඇති මොහොතක එතුමාගේ ජයග්‍රහණය,විජයග්‍රහණයක් කිරීමට අධිෂ්ඨානශීලිව කැප වෙමින් එතුමාට සුවිශේෂි ජයග්‍රහණයක් ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

එමෙන්ම මෙහිදී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා බලංගොඩ නගරයේ ප්‍රධාන බස් නැවතුම්පොළ, ඉරිදා පොළ, පොදු මං මාවත් හා ප්‍රජාශාලා විශාල වශයෙන් සංවර්ධනය කිරීම සදහා හැකියාව ලැබුනු බවත්, මෙතෙක් විශාල අඩු පාඩුවක්ව පැවති බලංගොඩ නගරයේ නගර සභා ක්‍රීඩා පිට්ටනිය සංවර්ධනය සඳහාද මේ වන විට මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බවත් පවසා සිටියේය. ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 342 මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බවත් ඉන් රුපියල් මිලියන 5ක මුදලක් ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා වෙන් කර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා මෙහි වැඩකටයුතු වර්ෂයක කාලයක් ඇතුළත නිමකිරීම සඳහා උපදෙස් ලැබී ඇති බවත් එම වැඩකටයුතු සැළසුම් කර ගැනීම සඳහා මෙන්ම වර්ෂ දෙක තුනකින් විනාශ නොවී වසර සිය ගණනක් පවතින ක්‍රීඩා පිටියක් බිහිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රමුඛ ප්‍රදේශයේ ක්‍රීඩා සංවර්ධන නිළධාරින්, ව්‍යාපාරික ප්‍රජාව හා සියළු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගැනීමට කටයුතු කරන බවත් පවසන ලදී.

ඉන් නොනැවතී ප්‍රතිපාදන වශයෙන් ලැබෙන රුපියල් මිලියන 342 ක මුදල යොදාගෙන බලංගොඩ නගරය සඳහා පොදු වෙළෙඳ සංකීර්ණයක් හා රංග ශාලාවක් සෑදීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත පවසන ලදී.

මන්ත්‍රී දීමනා සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ගරු මහින්ද රාජපක්ෂ රජය යටතේ සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී තුමන්ලාට වරප්‍රසාද වැඩි කර ඇති බවත් සභාපතිවරයෙකුගේ දීමනාව රුපියල් 25000 ක් ලෙසත් උප සභාපතිවරයෙකුගේ දීමනාව රුපියල් විසිදහසක් ලෙසත් ,මන්ත්‍රීවරයෙකුගේ දීමනාව රුපියල් 15000 ලෙසත් ඉහළ නංවා ඇති බවත් පැවසීය.ඊට අමතරව ගරු පළාත් සභා ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සභාපතිවරයෙකුගේ දුරකථන දීමනාව රුපියල් 5000 ක් ලෙසත් උප සභාපතිවරයෙකුගේ දුරකථන දීමනාව රුපියල් හාරදහසක් ලෙසත් ,මන්ත්‍රීවරයෙකුගේ දුරකථන දීමනාව රුපියල් 3000 ලෙසත් ඉහළ නංවා ඇති බවත් සභාපතිතුමාගේ ඉන්ධන දීමනාව රුපියල් 5000 ලෙස අනුමත කර ඇති බවත් , සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් සඳහා ලබදෙන දීමනාව රුපියල් 12000 දක්වා ඉහළ නංවා ඇති බවත් පවසන ලදී.එමෙන්ම මීට පෙර චක්‍රලේඛවල තිබූ සභාවට නොපැමිණෙන නියෝජිතයන්ගේ සභා දීමනාව නොගෙවීමට ගෙන තිබූ තීන්දුව ඉවත් කර එය ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

එමෙන්ම 2015 අයවැය මගින් වෙන් කල මුදලට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා පාලන පක්ෂයේ මන්ත්‍රිවරයෙකුට රුපියල් ලක්ෂ 20 ක මුදලකුත්, මහාමාර්ග අමාත්‍යාංශය හරහා වීරසුන්දරාරාම මාවත සංවර්ධනය සඳහා රුපියල් එක්කෝටි විසි ලක්ෂයක ප්‍රතිපාදන ලද බවත්,බාන්ස් රත්වත්ත මාවතින් පටන් ගෙන පෙට්ටිගල දක්වා සංවර්ධනය කිරීම සඳහා රුපියල් කෝටි 2ක ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්,නගර සභා පාර හරහා වැලිගම ස්ටෝර්ස් හි නිවස තෙක් ඇති පාර සංවර්ධනය වෙනුවෙන්ද ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, ගමින් ගමට,දොරෙන් දොරට,ගම නැඟුම,මග නැඟුම,පළාත් නැඟුම වැනි ව්‍යාපෘතින් ඔස්සේ විශාල කාර්යය භාර්යයක් සිදුකර ඇති බවත්,ජීවනෝපාය නංවාලීම සඳහා සමෘද්ධිලාභින් හා අනෙකුත් අය වෙනුවෙන් රුපියල් 50 000 ක ණය මුදලක් ලබාදීමට කටයුතු සලසා ඇති බවත්,දැයට කිරුළ වැඩසටහන ඔස්සේ ආර්ථික සංවර්ධන නිලධාරින් හරහා වැඩ නිමකර නොමැති නිවෙස් හදුනාගෙන රුපියල් 65 000ක ණය මුදලක් ලබාදීමට රජය විසින් කටයුතු කරගෙන යන බවත් ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දන්වන ලදී.

උතුර,දකුණ යා කරමින් යුද්ධය සඳහා වැය වූ මුදල් රටේ සංවර්ධනය සඳහා යොදවමින් , පළාත් පාලන මට්ටමේ දේශපාලනඥයින් සඳහාද ගම සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන රැසක් ලබාදෙමින් මහගු සංවර්ධන කාර්ය භාර්යක නිරත වන අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් දිවි පරදුවට තබා ක්‍රියා කිරීමට සූදානම් බව පැවසූ ගරු සභාපතිතුමා ගරු සභාවේ කාර්යයන් සාර්ථක ලෙස සිදු කර ගෙන යාමට අවශ්‍ය ශක්තිය ,ධෛර්යය සියළු දෙනාටම ලැබේවායි පවසමින් නිවේදන ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

**06:01 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය,ගබඩාව,පෙර පාසැල්, ආයුර්වේදය,ක්‍රීඩාගාරය,කොම්පෝස්ට් ව්‍යාපෘතිය ,විදුනැණ පියස,සම්පත් පියස,ලේකම් නිල නිවස,වැවේවත්ත හා ඕලුගංතොට ප්‍රජාශාලා,මහජන පුස්තකාලය හා තානායම යන අංශවලට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්විය යුතුයැයි පැවසූ ගරු සභාපතිතුමා සභාවේ අනුමැතිය පතමින් පහත සමීක්ෂණ මණ්ඩලය සුදුසු යැයි යෝජනා කල අතර එම කාර්යයන් අධීක්ෂණට සදහා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත්කර ගන්නා ලෙසද යෝජනා කරන ලදී.

1. සභාපති ප්‍රධාන කළමනාකරණ සහකාර,එස්.එච්.අමිතා කරුණාරත්න මිය
2. සාමාජික සංවර්ධන නිළධාරි ,ටී.ජී.කේශනි ප්‍රසාදිකා මිය
3. සාමාජික කළමනාකරණ සහකාර,පී මංගලිකා දමයන්ති මිය
4. සාමාජික කළමනාකරණ සහකාර,ප්‍රීතිකා දිල්හානි උක්වත්ත මිය.
5. සාමාජික කළමනාකරණ සහකාර,කුමාර සෙනෙවිරත්න මයා.
6. සාමාජික කළමනාකරණ සහකාර,එම්.සෙල්වරාණි මිය.
7. සාමාජික සංවර්ධන නිළධාරි, ලලිත් සමරජීව මයා.

02.මහජන පුස්තකාලයේ පොත් සමීක්ෂණය සදහා පුස්තකාලායාධිපති සමග එහි සේවය කරන කාර්යය මණ්ඩලය

03.තානායමේ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සදහා

1. සාමාජික සංවර්ධන නිළධාරි, අමිල මිහිරංග මයා.
2. සාමාජික කළමනාකරණ සහකාර,පී මංගලිකා දමයන්ති මිය
3. සාමාජික කළමනාකරණ සහකාර,එම්.සෙල්වරාණි මිය.//////11
4. සාමාජික තානායම් කළමණාකරු, ලහිරු වීරසිංහ මයා

ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර මන්ත්‍රිවරුන් දෙපළ ලෙස එම්.ටී.එම්.රූම් මැතිතුමා හා ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා පත්කර ගැනීමට තිරණය කරගත් අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:02 බස් නැවතුම්පොල සී 42 කඩකාමරයේ හිගකඩ කුලී ගෙවීම.**

ඩබ්.ඩී.ජයසේකර ය නඅය විසින් බස් නැවතුම්පොල සී 42 කඩකාමරයේ හිග කඩකුලී ගෙවීම සම්බන්ධයෙන් පත්වී ඇත් දුෂ්කරතා පවසමින් දඩ මුදල් ඉවත්කර දෙන ලෙස ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදුව මෙම වර්ෂයේ පමණක් මෙම සහනය ලබාදී දඩ මුදල් ඉවත් කිරිමට යෝජනා කරන ලදී. දඩ මුදල් ඉවත් කිරීම මේ වර්ෂයේ පමණක් සිදුකිරිමටත් කිසි සේත් මෙය ඉදිරි වර්ෂ සඳහා ගෙන නොයන බවත් සභාපතිතුමා විසින් ගරු සභාව වෙත පවසන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් ස්තුතිය පළකිරීම. සඳුන් ජයනාත් කහන්ගම**

අංක 26/16,කරව්කැටිය,බළන්ගොඩ පදිංචි සඳුන් ජයනාත් කහංගම ශිෂ්‍යයා විසින් ,ඔහුට ලබාදුන් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්වය වෙනුවෙන් ස්තුතිය පළතරමින් ගරු සභාපතිතුමා වෙත එවන ලද ලිපිය එතුමා විසින් මහ සභාවේ දැන ගැනීම පිණිස මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**06:04 2014 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාවේ කඩකුලිය සම්බන්ධව පැහැදිලි කර ගැනීම.**

2013.12.31 වන දින මහ සභා රැස්වීම් වාර්තාවේ 06:29 තීරණ අංකය යටතේ මහජන පොළ ආපන ශාලාවේ කඩ කුළිය රු.10,000 දක්වා අඩු කිරීමට ගත් තීරණයේදී වැට් හා එන්.බී.ටී. අයකල යුතු ආකාරය පිළිබඳව පැහැදිලි කර දෙන මෙන් ආදායම් අංශය විසින් කරතිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමන් විසින් වැට් හා එන්.බී.ටී. ද ඇතුළත්ව රු.10,000 ක මුදල ක් කඩ කුළී ලෙස අයකිරීමට ගරු සභාව වෙත යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 2015 අයවැය කෙටුම්පත අධ්‍යයනය සඳහා ඉදිරිපත් කිරීම.**

2015 අයවැය කෙටුම්පත ගරු මන්ත්‍රිවරුන්ගේ අධ්‍යයනය සඳහා ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත්කරන ලදී. මෙහිදී 2014.12.04 වන දින විශේෂ මහ සභා රැස්වීමක් පවත්වා අයවැය සභා සම්මතකර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සඳහා දුරකථන වියදම් ප්‍රතිපූරණය කිරීම.**

2014.11.01 දින ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාතේ සියළුම පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සඳහා පහත සඳහන් පරිදි දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමැතිය දුන් බව ගරු සභාපතිතුමා විසින් සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

1. ගරු නගරාධිපති /ගරු සභාපතිවරුන් සඳහා මාසික උපරිම සීමාව රු.5000/=
2. ගරු උප නගරාධිපතිවරුන්/ ගරු උප සභාපතිවරුන් සඳහා මාසික උපරිම සීමාව රු. 4000/=
3. අනෙකුත් මහජන නියෝජිතයින් සඳහා මාසික උපරිම සීමාව රු. 3000/=

**06:07 පළාත් පාලන ආයතනයන්හි මහජන නියෝජිතයන්හට ගෙවනු ලබන මාසික දීමනාව වැඩිකිරීම.**

පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටුකිරීමට හැකිවනු පිණිස අවශ්‍ය පහසුකම් සැපයීමට 2015 වසර සඳහා ඉදිරිපත් කල අයවැය යෝජනාවලින් පහත සඳහන් පරිදි සියළුම මහජන නියෝජිතයින්ට ගෙවනු ලබන දීමනාව 2014.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කර ඇති බව මහ සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

<u>මහ නගර සභා සඳහා</u>

| තනතුර | අනුමත කරනු ලබන මාසික දීමනා |
|---|---|
| ගරු නගරාධිපති | රු.30,000.00 |
| ගරු නියෝජ්‍ය නගරාධිපති | රු.25,000.00 |
| ගරු නාගරික මන්ත්‍රී | රු.20,000.00 |

<u>නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා</u>

| තනතුර | අනුමත කරනු ලබන මාසික දීමනා |
|---|---|
| ගරු සභාපති | රු.25,000.00 |
| ගරු උප සභාපති | රු.20,000.00 |
| ගරු සභිකයින් | රු.15,000.00 |

**06:08 නිවාඩු අනුමත කර ගැනීම . නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජෙසිංහ මැතිතුමා**

අසනීප තත්වය හේතු කොට ගෙන සභාව වෙත පැමිණිය නොහැකි බව දන්වමින් නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජෙසිංහ මැතිතුමා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර නිවාඩු අනුමත කිරිමට මහ සභාව තීරණය කරන ලදී.

**06:09 නාය යාම නිසා පදිංචි නිවස කඩා වැටීම- එම්.ජී.රණසිංහ**

අංක 442/2, උඩ ඇල්ලෙපොළ, බලංගොඩ පදිංචි එම්.ජී. රණසිංහ මහතාගේ නිවස පිටුපස ඉවුර කඩාවැටීම නිසා වහළට හා බිත්තිවලට බරපතල හානි සිදු වී ඇති හෙයින් ඒ සඳහා ආධාරයක් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ අපජල ප්‍රතිකාරක පද්ධතිය ඉදිකිරිමේ ඇස්තමේන්තුව**

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ අපජල ප්‍රතිකාරක පද්ධතිය ඉදිකිරිමේ වියදම ලෙස ඉදිරිපත් කර තිබූ රු.317,011.95 ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:02 බලන්ගොඩ ,බෝම්බුව සුසාන භූමියේ සුසාන ගෙයහි පොළව කොන්ක්‍රීට් කර සිමෙන්ති මැදීම සඳහා ඇස්තමේන්තුව**

බලන්ගොඩ ,බෝම්බුව සුසාන භූමියේ සුසාන ගෙයහි පොළව කොන්ක්‍රීට් කර සිමෙන්ති මැදීම සඳහා ඉදිරිපත් කර තිබූ රු.115,261.98 ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

**කසල ඉවත් කිරීමේ සේවාව ටෙන්ඩර් කිරීම**

2014.09.25 දින පැවති මහ සභාවේ යෝජනා අංක 6:3 අනුව 2015 වර්ෂය සඳහා කසල ඉවත් කිරීමේ සේවාව සඳහා අවශ්‍ය සේවකයින් සැපයීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමක් කරන ලදුව 2014.10.16 වන දින ටෙන්ඩර් විවෘත කරන ලද අතර, එහිදී කිසිදු ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් නොවූ හෙයින් නැවත ටෙන්ඩර් විවෘත කිරීමක් 2014.11.27 දිනැති මහ සභාවේදි සිදු කරන ලදී.

එහිදී අංක 63/3,රාස්සගල පාර,බලංගොඩ පදිංචි බී. ගුණරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද තිස්තුන් ලක්ෂ පනස් හතර දහසක මුදල අවම ලංසුව සේ සලකා 2015.01.01 සිට 2015.12.31 දක්වා කසල ඉවත් කිරීමේ සේවාව ඔහුට ලබාදීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

**මෙදින සභාව සඳහා යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් නොවිනි.**

## 11. යෝජනා

**11:01 ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

**11:01:01 ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ වෙළඳසැලක් සදහා අනුමැතිය ලබාදීමට ගරු සභාවට යෝජනා කිරීම.**

ධීවර සංස්ථාවේ මාළු වෙළෙඳ සැලක් ආරම්භ කිරීම සුදුසු බවට ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් 2014.10.30 සභාවාරයේදි කරන ලද යෝජනාවට ගත් තීන්දු හා තීරණ ප්‍රමානවත් පරිදි සභා වාර්තාවේ ඇතුළත්ව නැතැයි එතුමා විසින් කරන ලද චෝදනාව නිසා එම යෝජනාව මෙම සභා වාරයේදි නැවත සාකච්ඡා කිරීමට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ගෙනා යෝජනාව, ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී මෙම යෝජනාව සඳහා පක්ෂ හා විපක්ෂ ලෙස ඡන්දයක් පවත්වා තීරණයක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වැඩි දුරටත් දන්වන ලදී.

මෙහිදී පහත සඳහන් පරිදි අදහස් ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා

මහින්ද චින්තන සංකල්පයකට අනුව ධීවර සංස්ථාවේ මාළු වෙළෙඳ සැල් ආරම්භ කර අනෙකුත් පළාත් පාලන ආයතන 133 ක පමණ මේවන විට කරගෙන යන බවත්, මෙම නගරයේ එසේ නොකිරීමට හේතු මන්දැයි ගරු උප සභාපතිතුමා විසින් මෙහිදී ප්‍රශ්න කරන ලදී. මාළු වෙළඳුන් කිහිප දෙනෙකුගේ සුභ සිද්ධිය සළකා බලා නොව, දහස් ගණන් පාරිභෝගික ජනතාවගේ සුභ සිද්ධිය සළකා බලා මෙම යෝජනාව ගෙනා බව පැවසූ එතුමා තත්වයෙන් උසස් භාණ්ඩ දෙන ස්ථානය තෝරා බලා මිලදී ගැනීම ජනතාවගේ වගකීමක් බවත් ,පුරවැසි කමිටුවේදී ද මෙම යෝජනාව ගරු සභාපතිතුමා වෙත ලැබුන බවත් පවසමින් යෝජනාව සඳහා පක්ෂව අදහස් දැක්වීය.එමෙන්ම මහජන පොළ නීතියට අනුව පොළ භූමියේද මාළු විකිණීම නීති විරෝධී බව පැවසූ ගරු උපසභාපතිතුමා පවසා සිටියේ සතියේ දිනයන්හි පොළ භූමියේ මාළු අලෙවිය වැරදි සහගත වන අතර ඊට පොදු වෙළෙඳ සැල් ව්‍යාපාරිකයන්ද විරුද්ධ බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා

මෙම ප්‍රශ්නය පැති කිහිපයකින් බැලිය යුත්තක් බවත්, වැඩි තරඟකාරීත්වයක් තුළ සහනදායි මිලට මාළු ලබාගැනීමේ වාසිය පාරිභෝගික ජනතාවට ලැබෙන බවත්,මාළු වෙළදාම බස් නැවතුම්පළ අසළ ප්‍රදේශයකට ගෙන ඒමෙන් පොදු වෙළඳසැල වෙළඳුන්ට අවාසි සහගත තත්වයකට මුහුණ දීමට සිදුවන බවද සළකා බැලිය යුත්තක් බවත් පැවසීය. ගරු උප සභාපතිතුමාගේ යෝජනාව යහපත් බවත් ,ගැටළුව වී ඇත්තේ ස්ථානය පිළිබඳව ඇති නීත්‍යානුකුල තත්වය බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා නීත්‍යානුකුල තත්වය පිළිබඳව සළකා බැලීමේදිද පොදුවේ සියල්ලන්ටම සාධාරණ වන පරිදි ක්‍රියා කරන ලෙසට ඉල්ලා සිටින බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා පවසා සිටියේ ගරු උප සභාපතිතුමා ගෙනා මාළු වෙළෙඳ සැලක් ආරම්භ කිරීමේ යෝජනාවට විරුද්ධත්වයක් නොමැති බවත් මේ වන විටත් මස් හා මාළු වෙළදාම පොදු වෙළෙඳසැල තුළ ක්‍රියාත්මක වන අයුරින්ම ධීවර සංස්ථාවේ වෙළෙඳ සැලද පොදු වෙළෙඳ සැල තුළම ආරම්භ කිරීමට සුදුසු බවත්ය. එහිදී තත්වයෙන් උසස් මාළු සහනදායි මිලට අලෙවි කිරීමේදි පාරිභෝගිකයන් නිරායාසයෙන් ඒ දෙසට ඇදෙන බවත් , එය පිහිටා තිබෙන ස්ථානය ඒ සඳහා ගැටළුවක් නොවන බවත් ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

ගරු සභාපතිතුමා

මෙහිදි අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පාරිභෝගික සුභ සිද්ධිය සේම ප්‍රදේශයේ ව්‍යාපාරික ජනතාව රැක ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතු බවත්, එමනිසා පොදු වෙළෙඳ සැල තුළ හෝ සති පොලේ ස්ථානයක් ධීවර සංස්ථාව සදහා ලබා දීමට හැකියාව ඇති බවත්ය. පාරිභෝගික ජනතාවට සහනදායි මිලට සේවයක් සපයන්නේ නම්, ධීවර සංස්ථාව සඳහා ලබා දෙන ස්ථානය සදහා බලංගොඩ නගර සභාව මගින් ගනු ලබන කුළිය සහා තීරණයක් ගෙන අඩු කර දීමටද කටයුතු කල හැකි බවත් ගරු සභාපතිතුමා විසින් මෙහිදී වැඩි දුරටත් පවසන ලදී.

මෙහිදී නීතිය දෙයාකාරයකින් ක්‍රියාත්මක වන බවට නැගෙන චෝදනාවලට විසදුමක් ලෙස ඉරිදා පොළ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය සඳහා යෝජනාවක් කරන බව පැවසූ ගරු සභාපතිතුමා මස්,මාළු හා එළවළු සියල්ල සතියේ දින පහේම පොළ ඇතුළත විකිණීමට හැකි වන පරිදි ව්‍යවස්ථාව සංශෝධනය වියයුතු බවත් පැවසීය.මෙහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,බලංගොඩ ප්‍රාදේශීය සභාවේ පොළ පවත්වන්නේ කිරිමැටිතැන්න මහ පාරේ බවත් ඉතා ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වන බලංගොඩ නගර සභාවේ පොළ , සබරගමුව පළාතේ හොඳම පොළ ලෙස සම්මාන ලබාගත් බවත්, ඒ සඳහා මාධ්‍යයේද අවධානය යොමු කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා</u>

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා පවසා සිටියේ,පොදු වෙළෙඳ සල් ව්‍යාපාරික ජනතාවට අසාධාරණයක් වේ යැයි ඇති මතය නිසා පොලේ වෙළෙඳාම් කටයුතු සතියේ දිනවල නොපවත්වා ඉරිදා පමණක් කිරීම සුදුසු බව තමන්ගේ පෞද්ගලික මතය බවයි.එමෙන්ම, පොදු වෙළෙඳසැල් වෙළඳුන් පමණක් නොව පදික වෙළඳුන්ගේ පවා වෘත්තිය අයිතීන් නැති කිරීමට තමන් කිසිසේත් කැමැති නැති බව පැවසූ ගරු මන්ත්‍රීතුමා කෙසේ නමුත් ඉරිදා පොලේ මස්, මාළු. එළවළු විකිණීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා අතුරු ව්‍යවස්ථා සංශෝධන යෝජනාවට තම සහයෝගය ලබාදෙන බව ගරු මෙහිදී පවසන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ගරු සභාපතිතුමා ගෙනා අතුරු ව්‍යවස්ථා සංශෝධනයට තම සහයෝගය දෙන අතර , බස් නැවතුම්පොළට ආසන්න බැවින් මහජන පොළ ඇතුළත වෙළදාම් කටයුතු පවත්වා ගෙන යාම පාරිභෝගික ජනතාවටද මහත් පහසුවක් බවත්ය.වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා ,ධීවර සංස්ථාවේ වෙළෙඳ සැලක් මහජන පොළ තුල හෝ පොදු වෙළෙඳ සැල තුල ආරම්භ කිරීම සුදුසු බව තම අදහස බවත් මාංශ වර්ග මහජන පොළ තුළ විකිනීමට ඉඩ නොදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් කරන ලද මහජන පොළ තුල හෝ පොදු වෙළෙඳ සැල තුල ධීවර සංස්ථා වෙළෙඳ සැල ආරම්භ කිරීමේ අදහස තමා විසින් ස්ථිර කරන බවත් ,අතුරු ව්‍යවස්ථා සංශෝධනය කෙරෙහි එකඟතාවය පළ කරන අතරම ගව මස් කඩය මහජන පොළ තුළට ගෙන ඒම සිදු නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා</u>

සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් කරන ලද යෝජනා ස්ථිර කරන බව පැවසු ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා පවසා සිටියේ මස් කඩ මහජන පොළ තුළට ගෙන ,නොඑන ලෙසත් ඒවා පොදු වෙළෙඳ සැල තුලම පවත්වා ගෙන යාමට කටයුතු කරන ලෙසත් තමා විසින් ඉල්ලා සිටින බවය.

මෙහිදී බහුතරයගේ අදහස ධීවර සංස්ථාවේ වෙළෙඳ සැල මහජන පොළ තුල හෝ පොදු වෙළෙඳ සැල තුල ආරම්භ කිරීම සුදුසු යන්න බැවින් එලෙස ක්‍රියාත්මක වීම සුදුසු බව පැවසූ ගරු සභාපතිතුමා මෙදින න්‍යාය පත්‍රයේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ යෝජනාව සඳහන් නොකල බැවින්, ලබන සභා වාරයේදි ඒ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

**11:02 ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

**11:02:01 2015 වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලින් සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 30ක් වෙන් කිරීමට බලාපොරොත්තු වන අතර එම මුදලින් කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු පිළිබඳව යෝජනා ලබාගැනීම.**

2015 වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලින් සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 30ක් වෙන් කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාව වෙත දන්වා සිටි ගරු සභාපතිතුමා ,2015 දෙසැම්බර් මස 04 වෙනිදා පැවැත්වීමට නියමිත විශේෂ අයවැය සභා රැස්වීම සඳහා ඉදිරිපත්කිරිමට එක් එක් මන්ත්‍රිවරුන් විසින් එම මුදලින් කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු පිළිබඳ යෝජනා ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. එසේ ලිඛිතව ලබා ගන්නා යෝජනා පළාත් සභාව වෙත යවා අනුමත කර ගැනීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් මෙහිදි වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා උපදේශන කමිටු වාර්තාව

2014.11.20 වන දින පැවති සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා උපදේශන කමිටු ව රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 ආපදා කළමණාකරන කමිටු වාර්තා

2014.11.20 වන දින පැවති ආපදා කළමණාකරන කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ආපදා පෙර සූදානම් කමිටුව හඳුනා ගැනීම සඳහා ටී ෂර්ට් 60 ක් ලබාදිමට කමිටුවේදි ගත් තීරණය සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 2014 ඔක්තෝම්බර් මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 6,253,657.57 |
| වෙනත් ලැබීම් | 3,411,338.45 |
| මුළු ලැබීම් | 9,664,996.02 |
| පුනරාවර්තන වියදම් | 6,453,940.96 |
| වෙනත් වියදම් | 1,441,493.85 |
| මුළු වියදම් | 7,895,434.81 |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් ඉදිරිපත් නොවූයෙන් මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.10.01 සිට 2014.10.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.10.01 සිට 2014.10.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 597,295.20 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

සභාව විසින් ගන්නා තීන්දු ,තීරණ හා සිදුකරන සංවර්ධන කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් වෙන්නේ සභාවේ සිටින ජන මාධ්‍යවේදීන් නිසා බව පැවසූ ගරු මන්ත්‍රීතුමා එම සේවයට ඇගයීමක් ලෙස ඔවුන් සඳහා දැනට මන්ත්‍රී දීමනාවෙන් වෙන් කරන රුපියල් 250 මුදල වෙනුවට රුපියල් 500 මුදලක් වෙන්කිරීමට යෝජනා කරන බව පැවසීය. බළන්ගොඩ දුර ගමන් සේවා බස්රථ නැවතුම්පොළක් ස්ථාපිත කිරිම සම්බන්ධයෙන් තමන් දැක්වූ අදහස් පුවත් පත් වාර්තාවක පළ කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව පැවසූ මන්ත්‍රීතුමා මනා පාලනයක් නොමැති හෙයින් තානායම පාඩු ලබන නිසා ටෙන්ඩර් කිරිම සුදුසු යයි තමන් නොපැවසූ බවත් එසේ පුවත් පත් වාර්තාවක පළ කිරීම වැරදි සහගත බවත් පැවසීය.
මෙහිදී අදහස් දක්වමින් මාගා ආයතනය මගින් සිදුකරන බලංගොඩ වැලිහරනාව ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඉතා මන්දගාමීව සිදුවෙන බැවින් ජනතාව අපහසුතා රාශියකට මුහුණ දෙන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා කඩිනමින් එම කාර්යයන් නිම කිරීමට කටයුතු කරන ලෙස මෙහිදී යෝජනා කරන ලදී.එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාණු සඳහා දමන ස්ලැබ් අබලන් තත්වයේ පවතින නිසා මහජනතාවට හානි සිදුවිය හැකි බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම ක්‍රීඩාපිට්ටනිය හා මහජන පොළ අවට මාර්ගවල දමා ඇති ස්ලැබ්ද ඉතා අබලන්ව ඇති හෙයින් නගර සභා මුදලින් ඒවායෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට එතුමා විසින් යෝජනා කරන ලදී.

පසුගිය වකවානුවේ පැවති අධික නියගය නිසා වී ගොවිතැන විනාශ වූ අතර එහිදී ඇති වූ උග්‍ර සහල් හිඟය හේතු කොට ගෙන සහල් මිල ඉහළ ගියත් මේ වන විට සහල් මිල අඩු කිරීමට ක්‍රියා කර අතිගරු ජනාධිපතිතුමා හා වෙළෙඳ ඇමතිතුමා වෙත ස්තුතිවන්ත වන බව පවසන ලදී.තවද ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂක ලෙස ඉදිරිපත් වීම සම්බන්ධයෙන් කණගාටුවට පත්වන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා බටහිර බලවේගවලට ගැති නොවී රටේ සංවර්ධන කටයුතු ඉදිරියට කර ගෙන යාමට රජයට අවශ්‍ය ශක්තිය ලැබේවායි පතමින් ,සැමට සුභ අනාගතයක් වේවායි පතමින් අදහස් ප්‍රකාශකිරීම අවසන් කරන ලදි.

**14:02 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා මාධ්‍යවේදීන් සඳහා මන්ත්‍රී දීමනාවෙන් වෙන් කරන රුපියල් 250 මුදල වෙනුවට රුපියල් 500 මුදලක් වෙන්කිරීමට කරන ලද යෝජනාව ඉතා යහපත් බව පවසමින් ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එමෙන්ම මන්ත්‍රී දීමනා වැඩි කිරීම හා යතුරු පැදි ලබාදීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත ස්තුතිය පිරිනමන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ලබන ජනවාරි 8 වෙනිදා පැවැත්වෙන

ජනමතය උරගා බැලීමේදී, පසුගිය මැතිවරණවලදී ලැබූ පරිදි විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබාගනිමින් අතිගරු ජනාධිපතිතුමා ජයග්‍රහණය කරවීම සඳහා උපරිම ශක්තිය යොදවන බව මෙහිදී ප්‍රකාශ කරන ලදී.
පසුගිය අයවැය ප්‍රතිපාදන ලෙස ලද ලක්ෂ 2.5 මුදල යොදවා අඩු ආදායම් ලාභීන් සඳහා සෙවිලි තහඩු ලබාදීමට ක්‍රියාකල බව පැවසූ ගරු මන්ත්‍රීතුමා , එසේ ලබාදීමට නොහැකි වූ පිරිස් සඳහා මෙවර ලැබෙන ප්‍රතිපාදනවලින් ඉදිරි වර්ෂයේදී සෙවිලි තහඩු ලබාදීමට ක්‍රියා කරන බව පවසන ලදී.

### 14:03 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා

මෙහිදි අදහස් දක්වමින් පළාත් පාලන ආයතනයන්හි රජයේ මන්ත්‍රීවරුන්ට පමණක් යතුරු පැදි ලබා දී,විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා යතුරු පැදි ලබා නොදීම පිළිබඳව තොරතුරු දැන ගැනීමට අවශ්‍ය බව පැවසූ ගරු මන්ත්‍රීතුමා පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රී දීමනාව වැඩි කර ගැනීමේ කාර්යය සඳහා පාර්ලිමේන්තුවට යෝජනා ගෙන එමින් අරගල කර එය ලබාගැනීමට සහයදුන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස මැතිතුමාට හා මන්ත්‍රී දීමනාව ලබාදීමට ක්‍රියා කල අතිගරු ජනාධිපතිතුමාටත් සභාවක් ලෙස ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසන ලදී. මහජනයාගේ බදු මුදලින් ලබාදෙන මෙම මන්ත්‍රී දීමනාව ,මහජනතාවගේ සේවය උදෙසාම කැපකිරීමට හා එහි ගුණාත්මක බව වැඩිකිරීමට විශාල සහයෝගයක් වන බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩි දුරටත් පවසන ලදී.
එමෙන්ම ඔරලෝසු කණුව ළග මාවත් වෙන් කිරීමේ දැන්වීම් පුවරුවක් සවිකර නොමැති නිසා,නගරයට පිවිසෙන ආධුනික පිරිස් මාවත් හදුනාගැනීමේදි අපහසුතාවයට පත්වන නිසා ඒ අසළ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට ක්‍රියා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.තවද ලක්ෂ 72 ක පමන මුදලක් වැය කර අළුත්වැඩියා කරනු ලැබූ බෝම්බුව මාවත නැවත මාස 3ක් වැනි කෙටි කාලයක් ඇතුළත කෝටි 2ක් වැනි විශාල පිරිවැයක් දරා කාපට් කිරීම ජාතික ධනය විනාශ කිරීමක් ලෙස හැගි යන බවත් ගරු මන්ත්‍රීතුමා මෙහිදී පවසා සිටින ලදී.
එමෙන්ම කාර්යය මණ්ඩලයේ සේවය කරන රේණුකා මහත්මියගේ මවගේ අභාවය වෙනුවෙන් සභාවේ සියළුම දෙනා වෙනුවෙන් සභාවක් ලෙස ශෝකය ප්‍රකාශකරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා නගරයේ සෑම කටයුත්තකදීම මූලිකයා වශයෙන් ක්‍රියාකරනු ලබන්නේ ගරු සභාපතිතුමා බවත්, එසේ ක්‍රියා කිරීමේදි කිසිවෙකුට අසාධාරණයක් නොවන පරිදි,නීත්‍යානුකූලව ක්‍රියා කරන සෑම අවස්ථාවකදීම එතුමාට සහය දෙන බවත් පවසන ලදී.
නැවත වරක් අදහස් දක්වමින් සභාවක් ලෙස සියළුදෙනා රැස්වෙන්නේ, මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමට නිසා සභාව දේශපාලන වේදිකාවක් කර ගැනීම සුදුසු නැති බවත්, ද්වන්ධ සටනකදී පවා ප්‍රතිවාදීන් දෙදෙනාටම ලබාදෙන්නේ සමාන ප්‍රතිපාදන හෙයින් රජයේ මන්ත්‍රීවරුන්ට ලැබෙන වැඩි මුදල් ප්‍රතිපාදන නිසා වැඩි වැඩ කොටසක් සිදු කලහැකි බවත්, අඩු ප්‍රතිපාදන කොටසක් ලැබෙන විපක්ෂයෙ මන්ත්‍රීවරුන් වැඩ නොකරන්නේ යැයි පැවසීම යුක්ති සහගත නොවන බවත් පැවසීය.

### 14:04 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා

සෑම සභාවාරයකදීම පාහේ තමන් විසින් මං මාවත් අළුත්වැඩියා කර ගැනීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරන බවත්, ඒ සියල්ල සභාවේ සම්මත වෙන නමුදු ප්‍රායෝගිකව ඒවායෙහි වැඩ කටයුතු නොවීම සම්බන්ධයෙන් කණගාටුවට පත් වන බව මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් පවසන ලදී.
එමෙන්ම ඉදිරියේදි පැවැත්වීමට නියමිත මැතිවරණයේදි සහෝදර මන්ත්‍රීවරුන් ලෙස සාමකාමීව වැඩ කරමුයි ඉල්ලීමක් කල ගරු මන්ත්‍රීතුමා පොදු අපේක්ෂක ලෙස පත්කර ගනු ලැබූ ගරු මන්ත්‍රී මෛත්‍රීපාල සේනානායක මැතිතුමා ඒ වෙනුවෙන් තම තානාන්තර ඉවතලා විශාල කැප කිරීමක්

සිදු කල බව පවසන ලදී. රටේ සංවර්ධනය පමණක් නොව ආර්ථිකය ද සංවර්ධනය විය යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා එය අමාරුවෙන් ජීවත්වෙන සාමාන්‍ය ජනතාවටද දැනෙන සංවර්ධනයක් විය යුතු බවද ප්‍රකාශ කරන ලදී.

**14:05 ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා**

එක්සත් ජාතික පක්ෂයට තමන්ගේ ලාංඡනය හරහා නායකත්වයක් ඉදිරිපත් කිරීමට අසීරු හෙයින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව එම පක්ෂය කණගාටු විය යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ජාතිභේද ,ආගම්භේද අත්හැරදා සියළු ජාතින්ට ජීවත්වීමේ නිදහස ලබාදුන් අතිගරු ජනාධිපතිතුමා යුද්ධය නිමාකර,රටක් ආරක්ෂ කල ජන නායකයෙක් ලෙස ඉතිහාසගත වන බවත් නිදහසේ ගමන් ,බිමන් යාමට ,දරුවන්ට නිදහසේ අධ්‍යාපනය හැදෑරිමට ඉඩ කඩ ලබාදුන් ජ්‍යෙෂ්ඨ නායකතුමාට දීර්ඝායුෂ පතන බවත් මෙහිදී වැඩි දුරටත් අදහස් පල කරන ලදී.

එමෙන්ම මන්ත්‍රී දීමනාව වැඩි කරගැනීම වෙනුවෙන් ,අවු.15ක් තිස්සේ කැපවී ක්‍රියාකල පළාත් පාලන සංසදයේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාට ස්තුති කල ගරු මන්ත්‍රීතුමා,පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් වෙනුවෙන් ලබාදුන් යතුරු පැදි සඳහා අතිගරු ජනාධිපතිතුමාට හා ගරු පළාත් පාලන අමාත්‍ය අතාවුල්ලා මැතිතුමාට ස්තුති කරන ලදී.
මාධ්‍යවේදි දීමනාව සඳහා වෙන් කරන මුදල රු.250 කින් වැඩි කිරීම සඳහා සභය පළකර ගරු මන්ත්‍රීතුමා , හදවත මෙන් මාධ්‍යවේදින් සුරැකිය යුතු බව පවසන ලදී. ගරු මන්ත්‍රී මලීක්ෂා මැතිතුමාගේ මාවත් සංවර්ධනය කිරීමේ යෝජනාවට පිළිතුරු දුන් එතුමා දූනගහමඩල මාවතේ පටු මාවත් 4ක් මේ වන විට සංවර්ධනය කර අවසන් බව පැවසූ අතර ඉතිරිය සංවර්ධනය සඳහා විශාල මුදලක් වැය වන බවත් ඉදිරියේදි එම කටයුතුද සිදුවන බවත් පවසන ලදී.
රජයේ මන්ත්‍රීවරුන්ට තම පාක්ෂිකයන් වෙනුවෙන් හා ප්‍රදේශයේ සංවර්ධනය කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේ ලබාදීමට නියමිත ලක්ෂ 20 මුදල් ප්‍රතිපාදන යෝජනාව ගෙනා ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුති කල ගරු මන්ත්‍රීතුමා,රජයේ ඉදිරි වැඩ කටයුතු සඳහා යෝධ බල,යෝධ ශක්තිය ලැබේවායි පවසමින් අදහස් පළකිරීම අවසන් කරන ලදී.

**14:06 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.**

ඉතිහාසය ගත්කල ප්‍රාථමික මට්ටමේ තිබුන බලංගොඩ මූලික රෝහල ගරු මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ඉතා දියුණු මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබුන බවත්, එය නගරයට නන් දෙසින් පැමිණෙන විශාල ජනතාවකට විශාල සේවාවක් කරන මධ්‍යස්ථානයක් බවට පත්වී ඇතිබවත්, අඩු ආදායම්ලාභින්ගේ ජීවන තත්වය නංවාලීම සඳහා සමෘද්ධි වැඩසටහන යටතේ විශාල පිරිසකට සමෘද්ධි සහනය ලබාදීමට ක්‍රියා කල බවත්,පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා ඒ සියල්ල දේශපාලන වශයෙන් ලැබුන ජයග්‍රහණ බව පවසන ලදී.

එමෙන්ම එතෙක්,මෙතෙක් රජයක් විසින් ලබා නොදුන් ප්‍රතිපාදන රැසක්, නගර සභා හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් සඳහා මෙම රජය මගින් ලබාදුන් හෙයින් කොන්ද කෙළින් තියාගෙන ගමට ගොස් කථා කිරීමේ හා වැඩ කිරීමේ හැකියාව පළාත් පාලන මන්ත්‍රීවරුන් සඳහා ලැබුන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා උපාධිධාරි ගැටළුවලට විසඳුමක් ලෙසින් ලබාදුන් නව රැකියා වැඩ පිළිවෙල විශාල වශයෙන් අගය කල යුත්තක් බව පැවසීය.
ඉදිරි මැතිවරණ කටයුතු ඉතා උණුසුම්කාරි වනු ඇතැයි අපේක්ෂා කරන අතර එදත් ,අදත්,හෙටත් රජයේ ජයග්‍රහණය වෙනුවෙන් නොපිරිහෙළා කටයුතු කරන අතර යහපාලනයක් හා එඩිතර නායකත්වයක් වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා දිනවමුයි පවසමින් අදහස් පළකිරීම අවසන් කරන ලදී.

**14:07 ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමාගේ අපරිමිත ධෛර්ය මත නගර සභා පිට්ටනිය සංවර්ධනය කර ගැනීම සඳහා ලක්ෂ 500ක මුදල් වෙන් කර ගැනීම සම්බන්ධයෙන් , ක්‍රීඩා පිටිය කඩිනමින් සංවර්ධනය කරලීමේ පිපාසාවෙන් සිටි අයෙක් ලෙස ගරු සභාපතිතුමාට ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව පැවසීය.
එමෙන්ම කාර්යය මණ්ඩලයේ සේවය කරන රේණුකා මහත්මියගේ මවගේ අභාවය වෙනුවෙන් ශෝකය පළකිරීමටද මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසන ලදී.

2/3 බලය තුළින් ව්‍යවස්ථා සංශෝධනය කර,අතිගරු ජනාධිපතිතුමා තෙවන වරටත් ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීම පිළිබඳව තමන් පෞද්ගලිකව කැමති නැති වුවත් බිහිසුණු යුද්ධය නිමාකර රට දිනවූ විශේෂිත පුද්ගලයෙක් හැටියට එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් කැපවී ක්‍රියාකරන බව ගරු උප සභාපතිතුමා මෙහිදී පවසන ලදී.එමෙන්ම පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රී දීමනාව වැඩිකිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු උප සභාපතිතුමා මෙසේ දීමනා එකවර විශාල වශයෙන් වැඩි කිරීම මහජනයාගේ දෝෂ දර්ශනයට ලක් වී ඇති හෙයින් ගරු කටයුතු සේවාවක් ලෙස පැවති මන්ත්‍රීවරුන්ගේ වටිනාකම අඩු වී ඇති බවද පැවසීය.එමෙන්ම රජයේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් සඳහා ලබාදුන් යතුරු පැදි වෙනුවෙන් ස්තුතිය පළ කර ගරු උප සභාපතිතුමා එසේ බදු මුදල් අඩුකර රටේ අනෙක් ජනතාව වෙනුවෙන්ද සහන ලබාදෙන්නේ නම් එය ඉතා අගය කල යුත්තක් බව පැවසීය.

විපක්ෂය බලයේ සිටි කාලයේ මෙන් නොව,සභාවෙන් ප්‍රතිපාදන වශයෙන් ලැබෙන මුදල් පක්ෂ,විපක්ෂව සාධාරණ ලෙස බෙදා ගනිමින් සේවය කිරීමට කටයුතු කරන බව පැවසූ ගරු උප සභාපතිතුමා තමන් මධ්‍යස්ථව පිහිටා අදහස් ප්‍රකාශකරනවා විනා කිසිවෙකුට පහර ගැසීමේ අටියෙන් අදහස් ප්‍රකාශ කිරීමේ කිසිදු අරමුණක් නොමැති බවද පැවසීය.අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය නියත බවත්,ඒ සඳහා සහය වීමට කැපවීමෙන් ක්‍රියා කරන බවත් මෙහිදී ගරු උප සභාපතිතුමා වැඩි දුරටත් පවසන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්ලිව්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

මෙහිදී ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වැලිහරනාව ජල ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු පිළිබඳ අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, එය කෝටි 218 ක් පමණ වැය කරමින් සිදු කරන විශාල සංවර්ධන කාර්යයක් බවත්, ඒ සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් පසු වන බවත්, කඩිනමින් එහි වැඩ අවසන් කර ගැනීමේ අපේක්ෂාවෙන් සිටියද මාගා ආයතනය මගින් එහි කටයුතු හරියාකාරව නොකරන නිසා එම මාර්ගයේ ජනතාව විශාල වශයෙන් අපහසුතාවයට පත්වී සිටින බැවින් ඒ පිළිබඳව ජනමාධ්‍යයේ අවධානය යොමුකරන ලෙසද දන්වා සිටින ලදී. මෙහිදී වැඩි දුරටත් අදහස් දක්වමින් පසුගිය දිනවල මැණික් ගැරීමට යන බව පවසමින් තමා වෙත නගන ලද චෝදනා හේතුවෙන් වැලිහරනාව මාර්ගයේ ගමන් කිරීමට අකැමැති බව පැවසූ ගරු සභාපතිතුමා එවැනි අසත්‍ය සිද්ධීන් හුවා දැක්වීමේ හොඳම නිදර්ශනයක් ලෙස,පසුගිය දිනෙක සබරගමුව සරසවි සිසුන් රජය අපහසුතාවයට පත්වන පරිදි මාවත අවහිර කරමින් කරගෙන ගිය දැන්වීම් ප්‍රදර්ශනයට අවවාද කිරීම, තර්ජනය කරමින් මැර ප්‍රහාරයක් එල්ල කර බවට පුවත්පතක පළකර තිබීම පෙන්වා දෙන ලදී.
එමෙන්ම මාර්ගයේ අබලන්ව පවතින ස්ලැබ් පිළිසකර කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන බව ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා කරන ලද ඉල්ලීමට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද බෝම්බුව මාර්ගය නැවත කාපට් කිරීමේ ගැටලුවට පිළිතුර දුන් ගරු සභාපතිතුමා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මාර්ගයේ පයිප්ප නල එළීමේ දී මාර්ගය සම්පූර්ණයෙන් විනාශ වූ නිසා පිළිසකර කිරීමට සිදු වූ බව පවසන ලදී. මේ නිසා රජයේ මුදල් නාස්ති කළා යැයි චෝදනා කිරීම වැරදි සහගත බව පැවසූ ගරු සභාපතිතුමා එම මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ජේ සී බී යන්ත්‍රය හා ගල් රෝල පමණක් නොව අවශ්‍ය ආහාරපාන ද ලබා දෙමින් විශාල දායකත්වයක් නගර සභාවෙන් ලබා දුන් බවට පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී මලීක්ෂා මන්ත්‍රීතුමා විසින් මංමාවත් සංවර්ධනය සඳහා ගෙනෙන ලද යෝජනා සඳහා අනුමැතිය ලබා දී ඇති බවත්, මේ දිනවල පවතින අධික වර්ෂාව නිසා එම කටයුතු කල් ගොස් ඇති නමුත් මග හැර නොමැති බවත් මෙහිදී සභාපතිතුමා විසින් පවසන ලදී.

මාධ්‍යවේදීන් සඳහා වෙන් කරනු ලබන මාසික දීමනාව අවමය රුපියල් 500 වන ලෙස ලබා දීමට ක්‍රියා කරන බව පැවසූ ගරු සභාපතිතුමා ගරු නාගරික මන්ත්‍රී අසංක විජය නිල්මිණී මැතිතුමා විසින් මෙතෙක් තම මන්ත්‍රී දීමනාව ජනමාධ්‍යවේදීන් හට ලබා දුන් ලෙසින් ඉදිරියටත් එම දීමනාව ලබා දීමට එතුමා සමඟ සාකච්ඡා කරන බවට පවසන ලදී.

ගරු සභාපතිතුමා අවසාන වශයෙන් අදහස් දක්වමින් සංවර්ධන කාර්යය ඉටුකිරීම සමඟ මහජනයා රැක ගැනීමේ ශක්තිය මෙම රජය සතුව පවතින බවත්, ආණ්ඩු පක්ෂයේ ගරු නාගරික මන්ත්‍රීවරුන් ප්‍රමුඛ සභාපතිතුමා විසින් අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය විජයග්‍රහණයක් කිරීම සඳහා දිවි හිමියෙන් කටයුතු කරන බවත් පවසමින් ගරු සභාපතිතුමා මහා සභාවේ කටයුතු ප. ව. 2.30 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.